# නිශාන්ත-නදීෂා-නවරත්න-මල්ලිකා සන්ෆෝ මැරතන් ශූරතා දිනති

ලෝක පරිසර දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකා එක්සත් ජාතීන් මිත්‍රත්ව සංවිධාන (සන්ෆෝ) මගින් සංවිධානය කළ මැරතන් ධාවන තරගයේ අවුරුදු 18න් පහළ බාලක සහ බාලිකා ප්‍රථම ස්ථාන පිළිවෙලින් ඒ.පී. නිශාන්ත කුමාර සහ නදීෂා කුමාරි හිමිකර ගත්හ. අවුරුදු 18න් ඉහළ බාලක සහ බාලිකා ප්‍රථම ස්ථානය පිළිවෙලින් එම්. නවරත්න විජේසිංහ සහ මල්ලිකා චන්ද්‍රකාන්ති හිමිකරගත්හ.

"අපට අවැසි මළ මුහුදක් නොව ජීවමාන සාගරයකි" යන තේමාව යටතේ ජූනි 6 වැනිදා ගල්කිස්සෙන් ආරම්භවූ තරගය ගාලු මුවදොර පිටියෙන් අවසාන විය. මෙම තරගය අවුරුදු 18 ඉහළ සහ පහළ වශයෙන් කොටස් දෙකකින් බාලක සහ බාලිකා අංශ දෙකින්ම පැවැත්විණි.

තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය ජීවන් කුමාරතුංග මහතා තරගය ආරම්භ කිරීමේ සංඥාව දුන් අතර එදින සන්ධ්‍යාවේ කොළඹ නව නගර ශාලාවේ පැවැති ත්‍යාග සහ ජය සංකේත ප්‍රධානෝත්සවයට කථානායක වි.ජ.මු. ලොකුබණ්ඩාර මහතා සහභාගි විය.

තරග ප්‍රතිඵලඃ-

අවුරුදු 18න් පහළ (බාලක)

1. ඒ.පී. නිශාන්ත කුමාර, 2. අමිල මධුසංක, 3. දිනේෂ් ජයරත්න.

අවුරුදු 18න් පහළ (බාලිකා)

1. නදීෂා කුමාරි, 2. ඉන්ද්‍රා දමයන්ති, 3. නදීෂා මිහිරාණි.

අවුරුදු 18 න් ඉහළ (බාලක)

1. එම්. නවරත්න විජේසිංහ, 2. රොෂාන් මැල්, 3. චමල් වසන්ත.

අවුරුදු 18න් ඉහළ (බාලිකා)

1. මල්ලිකා චන්ද්‍රකාන්ති, 2. අමාලි මේනකා, 3. මංජුලා කුමාරසිංහ



අවුරුදු 18න් පහළ (බාලක) තරගයේ ප්‍රථම ස්ථානය දිනාගත් ඒ.පී. නිශාන්ත කුමාර ක්‍රීඩකයාට ජයග්‍රාහී කුසලානය කථානායක වි.ජ.මු. ලොකුබණ්ඩාර මහතා විසින් පිරිනමන ලද අවස්ථාව.